ඩී. ඩී. ගුණසේන උපහාර ප්‍රසංගයේ

"සිව් තත් සරණිය"

ජගත් මියැසියේ තත් වාද්‍ය භාණ්ඩවලට හිමි වන්නේ මුල් තැනක්. ලොව ඇති සංගීත මෙවලම් අතර තත් හඬවා වැයෙන භාණ්ඩ විශාල පරාසයක පැතිරෙනවා. ඒ අතරින් තත් සතරක් පමණක් හඬවා අන් සියළු තත් වාද්‍ය භාණ්ඩ අබිබවමින් සිටින්නේ වයලිනය යැයි කිවහොත් නිවැරදියි. ලොව ඕනෑම රටාවක වාදනයක දී නැතිව ම බැරි වයලිනයේ සිව් තත් හැඩවෙන්නේ අළුවකින්. සැබැවින් ම වයලිනය යනු එම මෙවලම පවුලේ එක් සාමාජිකයෙකු පමණයි.

අපගේ ගී ක්ෂේත්‍රයේ නිර්මාණ පිළිබඳව කතා කිරීමේදී ඒ සඳහා වාදනයෙන් දායක වන ශිල්පීන් ව සිහිපත් කෙරෙන්නේ ඉතාම අඩු වශයෙන්. වයලිනයේ සිව් තත් අතරින් මියැසි සරණියක් ම අප හට දායාද කළ කලාශූරී ඩී. ඩී. ගුණසේන ප්‍රවීණ වාද්‍ය ශිල්පියාණන්ව අගැයීමට සූදානම් වීම පිළිබඳව අප ලද ආරංචිය සැබැවින් ම සුභාරංචියක් ම වෙයි. එය ගී රස විඳි අප විසින් ඉටු කළ යුතු යුතුකමක් ද වෙයි.

ඩී. ඩී. ගුණසේනයන් වයලින වාදන ශිල්පියෙකු පමණක් ම නොවේ. සම්මාන ලාභී ගායන ශිල්පියෙකි. සිය නිවසේ වූ පරිසරය නිසාවෙන් ම සංගීතයට ලැදිවූ ගුණසේනයන් ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන් වෙත යොමු කරනු ලැබුයේ ඔහු කුඩා කාලයේදීමයි.ඒ සෙවනේ ලද පන්තරය සමගින් වසර 1971 දී ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ වාදක මණ්ඩලයට බැඳුන මේ තරුණ ශිල්පියාට කේමදාසයන්ගේ මෙන් ම ආර්. මුත්තුසාමි, ආර්. ඒ. චන්ද්‍රසේන, සෝමදාස අල්විටිගල, ප්‍රේමසිරි අතුකෝරළ, ලයනල් අල්ගම, පණ්ඩිත් අමරදේවයන් ඇතුලු ප්‍රවීනයන් රැසකගේ ම වාද්‍ය වෘන්දයන් හා මුහුව වයලිනය වැයීමට වාසනාව ලැබිණ. පසුගිය වසරක "අරුංගල්" ටෙලිනාට්‍යයේ ගැයූ ගීයක් සඳහා වසරේ හොඳම ගායන ශිල්පියා ලෙසින් සම්මාන කීපයක් ම ලැබූ ගුණසේනයන්ගේ මුල්ම ගැයුම වන්නේ "සොඳුර මට සමු දෙන්න-සමුදෙන්න" ගීයයි.

මේ වන විට ඩී. ඩී. ගුණසේනයන් පදිංචිව සිටින්නේ මෙල්බන් නුවර අප අතරයි. මෙල්බන් ගී ප්‍රසංග වේදිකාවට නැතිවම බැරි ශිල්පියෙකි, ඔහු. තනි වයලිනයෙන් වුව ද මෙතෙක් සපුරා ගැනීමට නො හැකි වූ මහා ගිස්තැනක් ගුණසේනයන් පුරාවාලුන්ගේ අසන්නන්, විඳින්නන් ආත්ලාදයට පත් කරවමින්. ශිල්පීය ඥානයෙන් ද, පළපුරුද්දෙන් ද, කුසලතාවයෙන් ද පිරි වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම ප්‍රවීණයෙකු වන එතුමන් හෘදයාංගම වූ හදවතකින් යුත් මිනිසත් බවින් පිරි සැබෑම මිනිසෙකි. අවංක බව, නිහතමානී බව උතුරා යන එවන් ප්‍රවීණයින් සැබැවින් ම අපේ කලා ලොව විරලයි. සැබෑ කලාකරුවකු වීමට නම් ඊට පෙර මනුෂ්‍යත්වය තිබිය යුතු යැයි අප අදහන දේට කදිම නිදසුනකි, ඩී. ඩී. ගුණසේන ශිල්පියාණන්. ඉතින් ඔහුගේ "සිව් තත් සරණිය" විඳිමින් ඔහුට උපහාර කරන්නට සූදානම් වන පිරිසගේ සද්කාර්යය පිළිබඳව අපි ගුණසේනයන් හා සාකච්ඡාවකට මුහු වීමු.

මෑත කාලයේ ගුණසේනයන්ට පිදුනු සම්මාන පිළිබඳව සිහිපත් කිරීම සාකච්ඡාවට හොඳ ඇරඹුමක් වේ යැයි අපි සිතුවෙමු.

"ඇත්තට ම තරුණ විය ඉක්මවලා ඉන්න මට මේ කාලෙ හැටියට සම්මාන තුනක් ම පිට පිට ම ලැබුණ එක ගැන මම සතුට ට පත් වෙනවා. "අරුංගල්" ටෙලි නාට්‍යයේ තේමා ගීතය ගැයුම වෙනුවෙන් ලැබුණු රාජ්‍ය ටෙලි නාට්‍ය සම්මානය, සුමති ටෙලි සම්මානය, ඕ. සී. අයි. සී. සම්මානය කියන සම්මාන තමයි ඒ. තවත් රාජ්‍ය සම්මාන ගණනාවක් ම ලැබිලා තියෙනවා. කලාවට කළ සේවය වෙනුවෙන්, ඉතා කෙටියෙන් පිළිතුරු දීම හිඟඩ ගුණසේනයන්ගේ සැටියකි.

"සිව් තත් සරණිය" උපහාර ප්‍රසංගයට නිමිත්ත වූ කාරණය පිළිබඳවයි අනතුරුව අප විමසිලිමත් වූයේ.

"අපි මිත්‍රයෝ කට්ටිය එක්කනු වෙලා කතා කරන කොට, ගීතයක් එහෙම ගායනා කරනකොට, අනේ අපි ෂෝ එකක් එහෙම කරමුකෝ කියලා පොඩි කතාවක් ආවා. ඒක තමයි දිගටම ගිගිල්ලා මේ තත්ත්වයට ආවෙ. ෆාහිම් මල්ලි තමයි මුල පිරුවේ මේ වෙලාවේ මේ දේ කරමු කියලා. අපේ ඉන්ද්‍රජිත් මල්ලි පනුගිය කාලේ කාර්ය බහුල වුණ නිසාත් ටිකක් කල්ගියා. දැන් ඉතින් මේ කට්ටියම මුදලුත් ඕන නෑ කියලා තමයි ප්‍රසංගයට ලෑස්ති වෙලා ඉන්නේ. වාදනයට විතරක් නෙවෙයි, අගික් දේවල් වලටත්."

"තබ්ලාව වාදනය කරන්න කෙනෙක් ලංකාවෙනුත් ගෙන්න ගන්නයි මේ අය හිතන්නෙ. එක්කෙනෙක් ගුවන් ටිකට් එකක් දෙන්නත් පොරොන්දු වුණාලු. " කොහොම වෙයි ද දන්නෙ නෑ."

ප්‍රසංගයේ ඉදිරිපත් කෙරෙන දේ පිළිබඳව ඉඟියක් හෝ ලබා ගැනීම පාඨක රසිකයිනට වැදගත් වේවි කිලයා සිතුවෙමු.

"මම ලංකාවෙ ඉන්නකොට නිර්මාණය කරපු " සිම්ෆනි" එකක් තියෙනවා. ඒ වගේ ම ටෙලි නාට්‍යයකට මම කරපු පසුබිම් වාදන, ගී අනුවාදන ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අමරදේවයන්ගේ ගී අනුවාදනවලට මුල් තැන දෙන්න වෙනවා. මොකද මම වැඩි කාලයක් වාදනයේ යෙදුනේ එතුමාගේ ප්‍රසංගවලයි. පටිගත කිරීම්වලයි. ඒ නිසා ඒ ගීත ඇසේම තියෙනවා....".

අප හට "සත් සමුදුර" චිත්‍රපටය සඳහා අමරදේ-වයන් ගැයූ "සිතිඳු සුදු මුතු තලාවේ" ගීය සිහිපත් වෙයි. ගුණසේනයන් එය තනි වයලිනයෙන් කළ වැයුම අප අසා ඇති නිසාවෙනි. එමෙන් ම හින්දි ගී අනුවාදනය වැයීමටත් රුසියෙකි. ඩී. ඩී. ගුණසේනයන් "ගීත ඇසේම තියෙනවා" යන්න ඇසෙන කල සිහිපත් වන තවත් දෙයක් වෙයි. හදවතින්ම වයලිනය වයන (බයි හාර්ට්) අප අතර සිටින දක්ෂතමයා ගුණසෙ-"නයන් බව අපි අසා ඇත්තෙමු. ස්වර සංගති සටහනට අනුව වයනවාට වඩා අළුව තුළින් හැඟීම් කවා ඒවා වැයීම වෙනම ම හැකියාවකි. ඊට වාදකයා තනුව පිළිබඳව සංවේදී විය යුතුයි. මෙහිදී අළුවට යොමු වන බර හා වේගය පාලනය කිරීම තුළින් සංවේදී වැයුමක් ඉදිරිපත් කෙ-රෙයි.

"සියළුම ගායකයින්ගේ ගීත වලට කැමති වුණාත් වැඩේට ගැලපෙන ගීත ටිකක් තෝර ගන්න ඕන. ශාස්ත්‍රීය අංග ඇතුලත් ගීතත් වාදනය කරනවා. ඒ වගේම ගීත කිහිපයක් ගායන කරන්නත් හිතාගෙන ඉන්නවා." ගුණසෙ-"නයන් අපගේ අතුරු පදණ සඳහා පිළිතුරු දෙමින් පවසයි. ඒ සෑම පිළිතුරක් ම කෙටිය.

"කේමදාස මාස්ටර් ගැනත් යමක් කියන්න ඕන" සොඳුර මට සමුදෙන්න ගීතය ගයන්න කියලා මට අවස්ථාව දුන්නෙත් මාස්ටර්. එයාගේ "ගිහි කඳු" කියලා ටෙලි නාට්‍යයකටත් මම ගායනා කළා. ඒ වුණත් සංගීතඥයින් ගායකයින් වෙන වෙනම හිතලා ගීත හරි වෙන නිර්මාණ හරි තෝරා ගන්න හිතුවේ නෑ. ප්‍රසංගය ගලාගෙන යන විදියට ගැලපෙන දේවල් ටිකක් තමයි ඉදිරිපත් කරන්න. බලාපොරොත්තු වෙන්නේ."

"ශාස්ත්‍රීය අංග වුණත් වැඩියම බරට වයන්න අදහසත් නෑ. හැමෝටම විඳින්න පුළුවන් දෙයක් තමයි කෙටියෙන් කරන්න හිතන්නේ."

"මෙහෙ අයට මේ වගේ වාදනය මුල් වුණ ප්‍රසංග හරියට හුරු නැති නිසා හිතා ගන්න බැරි වෙයි මේ කොහොම දෙයක් ද කියලා. ඒත් බලනකොට නම් ආස හිතේවි. ලංකාවෙන් මුලදී වැඩි ප්‍රතිචාර තිබුනේ නෑ. පස්සේ හැමෝම කැමති දෙයක් වුණා මේ වාදන ප්‍රසංග. ඉතින් අපි හැමෝටම ආරාධනය කරනවා ඇවිත් බලන්න කියලා..."

අප ඩී. ඩී. ගුණසේනයන්ගේ ආරාධනයත් සමගින් ස්තූතිපූර්වකව ඔහුට සමු දුන්නේ සංවිධායකයින්ගේ අදහසත් දැන ගැනීමේ ඊසියෙන්.

"ඇත්තටම ගුණසේන මාස්ටර්ගේ සංගීත ජීවිතයටත් දැන් අවුරුදු 50 ක් විතර වෙනවා. ඒ ගැනත් හිතලයි අපි මේ උපහාර ප්‍රසංගය සංවිධානය කළේ." අපි අතර සිටින රසිකයකු වන මව්ජුඩ් ෆාහිම් සහෘදයා අපට සිය අදහස් දැක්වූයේ තමන්ගේ මුළු කණ්ඩායම ම වෙනුවෙන්.

"ඇත්තට ම වාදක මණ්ඩලය මේ කටයුත්තට සහභාගී වෙන්නේ නොමිළයේ. ශාලාවටයි සමහර ප්‍රචාරක දැන්වීම් වලටයි ඇරෙන්න හැම දෙයක්ම අප ලැබෙන්නේ නොමිළයේ. ඉතින් මින් ලැබෙන දේ අපි ඩී. ඩී. ගුණසේන මාස්ටර්ට පරිත්‍යාග කරන එක තමයි අපේ ඊළඟ අරමුණ. මේක කණ්ඩායමක වැඩක්. අපේ මුළු කණ්ඩායමම ඉතාම විවෘතව, සද්භාවයෙන් යුතුවයි මේ වැඩේට සම්බන්ධ වෙන්නේ. ඉතින් හැමෝම ප්‍රසංගය බලන්න ඇවිත් මේ කටයුත්තට අපට දායක වෙන්න කියලා ඉල්ලා හිටිනවා." අපි ෆාහිම් ඇතුළු සැමට සුභ පතිමින් ස්තූති කළෙමු.

සිසිර දිසානායක

---

13 වන පිටෙන්

කියලා. නමුත් නීතියේ පැහැදිලිව සඳහන් වෙනවා ලිඛිත නීතියට සියළු ආඥා පනත් සහ සියළු නීති ඉංග්‍රීසියෙන් කියන්නේ ඇක්ට්ස් අයත්වෙන බව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ මොකක්ද ව්‍යවස්ථාදායක බලය පාවිච්චි කරලා පාර්ලිමේන්තුව හදන නීතියක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීතියක් නොවෙයි කියන එක හාස්‍ය ජනක කතන්දරයක්.

අපි නිකමට හිතමු ඔය කියන කතාව හරි කියලා. එහෙම නම් ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කළ හැක්කේ ව්‍යවස්ථාවේ තියන අර්ථ නිරූපන වගන්ති අනුව විතරයි. අර්ථ නිරූපන පනතේ දීර්ඝ වශයෙන් සඳහන් වෙනවා මාසයක් කියන්නේ මොකක්ද? දවසක් කියන්නේ මොකක්ද? සතියක් කියන්නේ මොකක්ද? කියන හැම දෙයක්ම. ව්‍යවස්ථාවේ සීමිත වගන්ති කීපයකට පමණක් අර්ථ නිරූපන දීලා තියනවා. උදාහරණයක් වශයෙන් ''පිළිගත් දේශපාලන පක්ෂයක්'' කියන්නේ මොකක්ද? ''රජයේ නිලධාරියා'' කියන්නේ මොකක්ද ආදී වශයෙන්. ඒ හැර අනෙක් සියල්ල තියෙන්නේ අර්ථ නිරූපන ආඥා පනතේ. ඔය කියන තර්කය අනුව අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අදාළ වෙන්නේ පිරිමින්ට පමණයි කියා තර්ක කරන්න පුළුවන්. මොකද ව්‍යවස්ථාවේ කොහෙවත් නෑ ''ඇය'' කියා. හැම තැනම තියෙන්නේ ''ඔහු'' කියලා.

අර්ථ නිරූපන ආඥා පනතේ තියනවා ඕනෑම නීතියක සඳහනක් තියනවා නම් ''පිරිමියා'' කියා එය ගැහැණියක් පිළිබඳවද කරන ලද සඳහනක් සේ සැළකිය යුතුයි කියා. අර්ථ නිරූපන ආඥා පනත ව්‍යවස්ථාවට අදාළ වෙන්නේ නැත්නම් ව්‍යවස්ථාවේ ''ඔහු'' කියලා තියන තියා පිරිමින්ට විතරයි ඡන්දය ඉල්ලන්න පුළුවන් වෙන්නේත්. ගැහැණුන්ට බැහැ. එතියා ව්‍යවස්ථාවට අර්ථ නිරූපන ආඥා පනත අදාළ නැහැ කියන එක පිළිතුරු දීමටවත් නොවටිනා බොළඳ කතාවක් විතරයි. ඒ අනුව ලෝකයේ පිළිගත් නීති සිද්ධාන්තයනට අනුව 18 වන සංශෝධනය අතීතයට බලපාන්නක් නොවෙයි.

එය අතීතයට බලපාන ලෙස කරන්න තිබුණා. නමුත් කරලා නෑ. එතකොට අපිට කියන්න පුළුවන්ද ගිහි කෙටුම්පත්කරුට වරදින්න ඇතියි කියලා. හොඳයි අපි ඒකත් හිතමු නීති කෙටුම්පත්කරුට වැරදුණා කියලා. ඔහුට වරදින්න ඇති. නමුත් එවැනි වරදක් වුණාම ලෝකේ හැම තැනම කරන්නේ ඒ වරද නිවැරදි වෙන ආකාරයට නීතිය සකස් කිරීමයි. නමුත් 18 වන සංශෝධනයේදී එවැන්නක් පවා සිදුව නැහැ. එතියා ජනාධිපතිවරණයක් කැඳවීමට හෝ නැවතත් ජනාධිපතිවරණයකට ඉදිරිපත්වීමට හෝ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට හැකියාවක් නැහැ.

MASTER TUTORING ACADEMY
MTA
"Your success is our satisfaction"

Master Tutoring Academy

New Centre will be started at

36, Kincumber Drive, Glenwaverley

- Biology Year 11 & 12
- Science Year 9 & 10
- YEAR 3 & 4 English/Maths
- YEAR 5 to10 English/Maths
- Scholarship classes (Mel.High, Macrob, John Monash)
- Small group classes (Max 10 students per class)

Coordinated By – Nihal Kodikara (B.Sc.,M.Phil.,MBA)

Tel: 0425 403 105

Email: admin@mastertutoring.com.au

Web : www.mastertutoring.com.au